# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# මුදල් (සංශෝධන)

**2018 අංක 35 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය විසින් 2026 මැයි මස 06 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2026 අප්‍රේල් මස 23 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[62 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 15.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් 2018 අංක 35 දරන මුදල් පනතේ 44 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ 2026 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව වාණිජ මෙහෙයුම් ආරම්භ කරනු ලබන අලුතින් ඉදිකරන ලද යම් දුරකථන සන්නිවේදන කුළුණක් සම්බන්ධයෙන් අවුරුදු පහක කාලසීමාවක් සඳහා බදු නිදහස් කිරීමක් ප්‍රදානය කිරීම වේ.

එල්.ඩී.-ඕ. 75/2025

## 2018 අංක 35 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2026 අංක      දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2018 අංක 35 දරන පනතේ 44 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** 2018 අංක 35 දරන මුදල් පනතේ 44 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "බද්දක් අය කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"බද්දක් අය කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, 2026 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව වාණිජ මෙහෙයුම් ආරම්භ කරනු ලබන අලුතින් ඉදිකරන ලද යම් දුරකථන සන්නිවේදන කුළුණක් සම්බන්ධයෙන් මේ පනත ආරම්භ වන දින සිට අවුරුදු පහක කාලසීමාවක් සඳහා අය බද්ද අය නොකළ යුතු ය.";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "සමාන වාරික හතරකින් පිළිවෙලින්" යන වචන වෙනුවට "(1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව සමාන වාරික හතරකින් පිළිවෙලින්" යන වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

PL 15745 - 342(2026/05)